# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

අංක 2256/21- 2021 නොවැම්බර් මස 30 වැනි අඟහරුවාදා - 2021.11.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට දිවුලපිටිය ජල යෝජනා ක්‍රමය යටතේ අකරගම ජල කුළුණ ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/03/GQ/285

2021 නොවැම්බර් මස 26 වැනි දින,

ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර''
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 58/සී, අකරගම උතුර ග්‍රාම නිලධාරි වසමේ පුංචිමඩම්පැල්ල ගමේ පිහිටි මේ සමඟ එවන දළ සැලැස්මේ දැක්වෙන පුංචිමඩම්පැල්ල නමැති සම්පූර්ණ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.11239ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස් දෙක.


1A - G 35468 - 21 (2021/11)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කැබලි අංක : 1
ඉඩමේ නම : පුංචිමඩම්පැල්ල
ප්‍රමාණය : හෙක්ටයාර් 0.09925

උතුරට : පුද්ගලික ඉඩම
නැගෙනහිරට : පුද්ගලික ඉඩම (පොල්වත්ත)
දකුණට : පුද්ගලික ඉඩම
බටහිරට : ක්‍රීඩාංගනය

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනය : 01. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල

කැබලි අංක : 2
ඉඩමේ නම : පුංචිමඩම්පැල්ල
ප්‍රමාණය : හෙක්ටයාර් 0.01314

උතුරට : පුද්ගලික ඉඩම
නැගෙනහිරට : කැබලි අංක 1 ඉඩම
දකුණට : ක්‍රීඩාංගනය
බටහිරට : ප්‍රධාන පාර

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම සහ ලිපිනය : 01. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල

---

## ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියට අනුව මා විසින් 2020.09.16 දින අංක 2193/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1A පිටුවේ අංක 10-48 යටතේ පල කරන ලද 92 වැනි වගන්තිය නියමයේ ඉඩමේ ප්‍රමාණය අක්කර 1 1/2 ලෙස සඳහන් වුවත් එය අක්. 02 රූඩ් 00 පර්. 17.82ක් ලෙස සංශෝධනය විය යුතු බව 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ජල සම්පාදන අමාත්‍ය වාසුදේව නානායක්කාර වන මම මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/02/GL/161

2021 නොවැම්බර් මස 26 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
ලක්දිය මැඳුර,
අංක 35, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත,
බත්තරමුල්ල.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.